# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2069/4 – 2018 මැයි 01 වැනි අඟහරුවාදා – 2018.05.01

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* මො/ආ/සං/03/අත්.
*ඉඩම් අමා. අංක:* 4/3/8/2015/පීසී/87.

මොනරාගල මහානාම කණිටු විදුහල සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, මොනරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුප්පනේ ගමේ පිහිටි මොනරාගල මැනුම් අධිකාරී විසින් පිළියෙල කර ඇති අ.ග.පි. අංක 172, අතිරේක අංක 393 පත්‍ර අංක 434 හි දැක්වෙන ඉඩම්.

උපලේඛනය

ඉඩමේ නම: පල්ලෙඅරාවේවත්ත නොහොත් හෙලහේනෙවැටවත්ත; මුළු ප්‍රමාණය: හෙක්. 0.3661.

01. **කැබලි අංක 3449**
ඉඩමේ නම: පල්ලෙඅරාවේවත්ත නොහොත් හෙලහේනෙවැටවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: 1. විජේවීර ගුණවර්ධන මහවිධානේලාගේ ඇල්බට් සිල්වා, 2. විජේවීර ගුණවර්ධන මහවිධානේලාගේ ගේබ්‍රියෙල්, 3. විජේවීර ගුණවර්ධන මහවිධානේලාගේ ඇලන් නෝනා, 4. විජේවීර ගුණවර්ධන මහවිධානේලාගේ සොපිනෝනා; ප්‍රමාණය: හෙක්. 0.3661.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් 2018 මැයි මස 29 වැනි දින පෙ.ව10.00ට.මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2018 මැයි මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ජී. යූ. කේ. අල්ගෙවත්තගේ,
ප්‍රාදේශීය ලේකම්,
මොනරාගල.

2018 අප්‍රේල් මස 25 වැනි දින,
මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 416